# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,699 — 1959 මාර්තු 13 වැනි සිකුරාද — 13.3.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස–පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 237 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 237 | මාගී කොමිටි දැන්වීම ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම ... ... | 238 |


## පළාත් පාලන නිවේදන

### කැකිරාව නගර සභාව

**1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනත**

1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපණතේ 13 ඒ (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරී තැන වූද, කැකිරාව සුළු නගර සභාවේ සභාපති වූද, ජී. ඩී. ඩේවිඩ් වන මම, 1959යේ වර්ෂයෙහි, පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දිනවල දී කැකිරාව සුළු නගර සභා ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

1959 මාර්තු 25.
1959 අප්‍රේල් 23.
1959 මැයි 22.
1959 ජූනි 21.
1959 ජූලි 20.
1959 අගෝස්තු 18.
1959 සැප්තැම්බර් 17.
1959 ඔක්තෝබර් 16.
1959 නොවැම්බර් 1.
1959 නොවැම්බර් 15.
1959 දෙසැම්බර් 15.

ජී. ඩී. ඩේවිඩ්,
කැකිරාව සුළු නගර සභාවේ සභාපති.

1959 මාර්තු 3 වැනි දින,
කැකිරාව සුළු නගර සභා කායභාලයේ දීය.

## අතුරු ව්‍යවස්ථා

ජීබී. 14/36/9.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ කැකණ්දුර ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමතකරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ පළාත් පාලන කාර්යාලයේ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1953තේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, කැකණ්දුර ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාවට පමණක් ආදාළ වන පරිද්දෙන් 1956 යේ මැයි මස 22 වැනි දින අංක 10,932 දරණ ගැසට් පත්‍රයේ පළවූ අතුරු ව්‍යවස්ථාවෙන් සංශෝධිතවූ ගම්කාර්ය සභා පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා, එහි (3) වැනි ඡේදය එක්කම ඊළඟටවූ x වැනි කාණ්ඩයේ 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සහ (3) වැනි ඡේදය එක්කම ඊළඟටවූ xi වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේද මෙහි පහත සඳහන් අළුත් ඡේදය යෙදීමෙන් තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ. එනම් :—

" මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ නිකුත්කරනලද කිසියම් බලපත්‍රයක් සම්බන්ධයෙන්වූ බලපත්‍ර ගාස්තු, එකී බලපත්‍රය නිකුත්කරනලද අවුරුද්දේ මාර්තු මාසයේ 31 වැනි දින හෝ ඊට මත්තෙන් කාර්ය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු වන්නේය " යනුය.

# විවිධ දැන්වීම්

## මාලිම්බඩ ගම්කායශී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන හවත්, මෙම බලපත්‍රය නිකුත්කිරීමට විරුඩව මාලිම්බඩ ගම්කායශී සභා සීමා ප්‍රදෙශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැන විරුඩ වන්නේ අසවල් හේතුන් නිසායයි දැක්වෙන ලියවිල්ලක පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවනද සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (201 වැනි පරිච්ඡේදයේ) අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශොධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| (1) කේ. බී. ඇම්. මුක්තාර්, මදුරාගොඩ, දෙණිපිටිය | පිංවත්ත-වටගෙදරමුල්ල ගවමස් සහ එළු මස් |

ගම්සභා කායශීලය,
1959.3.2 දින
තෙලිජ්ජවිල.

හැන්රි ඇලස්,
ප්‍රධානතැන,
මාලිම්බඩ ගම්කායශී සභාව.

---

## ගල්බොඩ කෝරලේ ගම්කායශී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත
### (201 වන පරිචෙඡදය)

මෙහි පහත විස්තර දැක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කොට ඇති බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන ගල්බොඩ කෝරලේ ගම් ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දහහතර දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වන පරිචෙඡදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ගම්කායශී සභා කායශීලය,
මාවනැල්ල,
මාර්තු 4, 1959.

ඇම්. ආර්. බී. දස්වත්ත,
සභාපති.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම නම | ස්ථානය | බලපත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| ඇම්. ඇල්. ඒ. හකීම් | අංක 228, කොළඹ-නුවර පාර, හිඟුල නගරය | හරක් මස් |
| ඇම්. ඇල්. සරීබුදීන් | අංක 338, කොළඹ-නුවර පාර, මාවනැල්ල නගරය | හරක් මස් |
| ඊ. අබ්දුල් කරීම් ... | අංක 104, කොළඹ-නුවර පාර, මාවනැල්ල නගරය | හරක් මස් |
| එච්. ඇල්. මුහම්මදු ඉබ්‍රාහිම් | අංක 123, කොළඹ-නුවර පාර, මාවනැල්ල නගරය | හරක් මස් |
| එච්. ඇල්. අබ්දුල් සමද් | අංක 332, කොළඹ-නුවර පාර, මාවනැල්ල නගරය | එළු මස් |

---

## විශෙෂ නිවේදනයයි

1959 මාර්තු 27 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 මාර්තු මාසයේ හතරවැනි සුමානයේ ගැසට් පත්‍රය, 1959 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 මාර්තු 23 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 10 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

**බර්නාඩ් ද සිල්වා,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.